සති පාසල

7 ශ්‍රේණිය | ගණිතය | අගෝස්තු 4වන සතිය

22 - ප්‍රතිශත

01. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්

- පෙළ පොතෙහි පිටු අංක 103 හා 104 යටතේ ඇති **හරය 100 නොවන භාගයක් ප්‍රතිශතයක් ලෙස දැක්වීම** පිළිබඳව අධ්‍යයනය කරන්න.
- පෙළ පොතෙහි පිටු අංක 106 හා 107 යටතේ ඇති **දශම සංඛ්‍යා ප්‍රතිශත ලෙස දැක්වීම** පිළිබඳව අධ්‍යයනය කරන්න.
- පෙළ පොතෙහි පිටු 104, 105 හි ඇති 22.2 අභ්‍යාසයේ නිරත වන්න.
- පෙළ පොතෙහි පිටු 107 හි ඇති 22.3 අභ්‍යාසයේ නිරත වන්න.

02. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කර ගත හැකි ආධාරක

- 7 ශ්‍රේණිය ගණිතය දෙවන පෙළ පොත (පිටු අංක 106 සිට 107)
- E - නැණ පියස වෙබ් අඩවිය
  https://www.enenapiyasa.lk/lms/course/view.php?id=62#section-23
- E - තක්සලාව වෙබ් අඩවිය
  https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=987&section=24
- ගුරු ගෙදර නාලිකාව
  https://www.youtube.com/watch?v=StNCpXpyD4A&list=PLlyv4_Vxwl-zvyOZDe4KBMGJzsFDTs0p0&index=10
- DP Education
  https://www.youtube.com/watch?v=IBo7m3a-HIs&list=PLcUOoycaDS-k0dtIfHHriJpJmc3V0Ouz4&index=24

03. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල

- හරය 100 නොවන භාගයක් ප්‍රතිශතයක් ලෙස දැක්වීම
- දශම සංඛ්‍යා ප්‍රතිශත ලෙස දැක්වීම

04. ඇගයීම

1) වෙළෙන්දෙකු මිලදී ගත් අඹ ගෙඩි 50 ක තොගයකින් 8 ක් නරක් වී ඇත.

i) නරක් වූ අඹ ප්‍රමාණය මුළු අඹ ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

ii) නරක් නොවූ අඹ ප්‍රමාණය මුළු අඹ ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

iii) නරක් නොවූ අඹ ප්‍රමාණයෙන් හරි අඩක් හොඳින් පැසුනු අඹ වේ.

iv) අඹ තොගය මිල දී ගත්තේ එක් ගෙඩියක් රුපියල් 8 බැගිනි. පැසුණු අඹ ගෙඩියක් රුපියල් 10 බැගින් ද නොපැසුණු අඹ ගෙඩියක් රුපියල් 9 බැගින් ද විකුණූ විට ඔහු ලබන්නේ ලාභයක් ද පාඩුවක් ද? එම ලාභය හෝ පාඩුව ප්‍රතිශතයක් ලෙස දක්වන්න.